# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

**ඒකක පරීක්ෂණය**

| 7 | බුද්ධ ධර්මය | 01 පාඩම |
|---|---|---|

**පහත සඳහන් කියමන් හරි නම් ලකුණ ( √ ) ද වැරදි නම් ( x ) ලකුණ ද ඉදිරියේ ඇති කොටුව තුළ යොදන්න**

1. පඨමං බෝධි පල්ලංකං යන ගාථාවෙන් අප වන්දනා කරන්නේ බෝධීන් වහන්සේටය.
2. බුදු රජාණන් වහන්සේ පස්වන සතියේ වැඩ සිටියේ අජපල් නුග රුක මුලය.
3. තණ්හා, රතී, රගා යන මාර දූවරුන් පැමිණියේ තෙවන සතියේ ය.
4. තපස්සු භල්ලුක යන වෙළඳ දෙබෑයෝ බුදුරජාණන් වහන්සේ ට අත්සුණු සහ මී පිඩු පූජා කළහ.
5. ප්‍රථම ද්වෙවාචික උපාසකවරුන් ලෙස හැඳින්වෙන්නේ කෝලිත උපතිස්ස දෙදෙනාය.
6. ලෝකයාට දහම් දෙසන ලෙසට බුදුරජාණන් වහන්සේට ආරාධනා කළේ සහම්පති මහා බ්‍රහ්මයා ය.
7. බරණැස ඉසිපතනය කරා වඩින බුදු රජාණන් වහන්සේට අතරමගදී මුණ ගැසුණේ උපක ආජීවකයාය.
8. ඔබ අනන්ත ජින ද යි බුදුරජාණන් වහන්සේගෙන් විමසන ලද්දේ පස්වග තවුසන් විසිනි.
9. බුදුරජාණන් වහන්සේගේ මංගල ධර්ම දේශනාව වූයේ මහා මංගල සූත්‍රය යි.
10. අනන්ත ලක්ඛණ සූත්‍ර දේශනාව අසා පස්වග තවුසෝ රහත් වූහ.
11. තෙරුවන් සරණ ගිය පළමු උපාසිකාවන් වීමේ ගෞරවය හිමිවූයේ ඛේමා, උප්පලවණ්ණා යන දෙදෙනාටය.
12. තෙරුවන් සරණ ගිය පළමු උපාසකයා වූයේ බරණැස් සිටුතුමාය.
13. ප්‍රථම රහතුන් සංඛ්‍යාව 50 නමකි.
14. බුදුරජාණන් වහන්සේගේ දෙවන ධර්ම ධූත පිරිස වූයේ ජටිල සහෝදරයින් ඇතුලු පිරිසයි.
15. බුදුරජාණන් වහන්සේගේ පළමු ලංකාගමනය සිදු වූයේ දුරුතු පොහොය දිනකදීය.
16. මහියංගණ චෛත්‍යයේ නිධන් කර ඇත්තේ කේශ ධාතූන් වහන්සේලාය.
17. බුදු සසුනේ සෝවාන් වූ පළමු රජතුමා වන්නේ බිම්බිසාර රජතුමාය.
18. බුදු සසුනේ පළමු ආරාම පූජාව කරන ලද්දේ සුද්ධෝදන රජතුමා විසිනි.
19. කෝලිත හා උපතිස්ස යන දෙදෙනා සැරියුත් හා මුගලන් නමින් බුදු සසුනේ පැවිදි වූහ.
20. විසිදහසක් රයතන් වහන්සේලා පිරිවරා ගත් බුදුරජාණන් වහන්සේ වෙසක් පුන් පොහෝ දිනයේ කිඹුල්වත් පුරයට වැඩියහ.

සැකසුම:-රුචිරා පුෂ්පාදරී